# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
### වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2016

2022 - මාර්තු

**BCOM E1025 - සූක්ෂම ආර්ථික විද්‍යාව**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්ණ අංක 01**

අ. සාර්ව ආර්ථික විද්‍යාව සහ සූක්ෂම ආර්ථික විද්‍යාව අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. " හිඟකම සියලු ආකාරයේ ආර්ථික ගැටළු වලට මූලික වේ." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද ? ඔබේ ප්‍රකාශයට හේතු දක්වන්න.

(ලකුණු 05)

ඇ. පහත සඳහන් කුමන ප්‍රකාශයන් සත්‍ය ද , අසත්‍ය ද යන්න සඳහන් කරන්න ?

i. වෙළඳපල යාන්ත්‍රණය මගින් සියලු ආර්ථික ගැටලු විසඳා ගත හැකිය.

ii. නිෂ්පාදන හැකියා මායිම සම්පත් වැඩිවීමකින් තොරව ඉහළට විතැන් විය හැක.

iii. ආවස්ථිත පිරිවැය නිෂ්පාදන පිරිවැයට සමාන වේ.

iv. යෙදවුම් මිල අඩුවීම සැපයුම් වක්‍රය වමට විතැන්වීමට හේතු වේ.

v. බාල භාණ්ඩයක් සඳහා ඇති ආදායමේ බලපෑම සෘණාත්මක වේ.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 02**

අ. ඉල්ලුමේ වැඩිවීම සහ ඉල්ලුම් ප්‍රමාණයේ වැඩිවීම අතර වෙනස කුමක්ද ?

(ලකුණු 05)

ආ. සැපයුමට බලපාන මිල නොවන මූලික සාධක ලැයිස්තුගත කර ඒවා සැපයුම් වක්‍රයට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඈ. ඉල්ලුමේ ශ්‍රිතය P = 100- 5 Q මගින් නිරූපනය වන අතර, සැපයුම් ශ්‍රිතය P = 40 + 10Q ( P යනු මිල සහ Q යනු ප්‍රමාණය ) වේ. සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 04)

ඉ. සැපයුම සහ ඉල්ලුම ප්‍රස්ථාර සටහන් භාවිතා කරමින්, ස්වෙට්ෂට් (sweatshirts) වෙළඳපොල සඳහා පහත සිදුවීම්වල බලපෑම දක්වන්න.

i. ලෙදර් ජැකට් මිල පහත වැටේ

ii. අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ඉන්දියාවේ කපු වගාවට හානි සිදුවිය.

iii. නවීන රෙදි විවීමේ යන්ත්‍ර නිපදවනු ලැබීම.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 03**

අ. උපරිම මිල පාලනයේ බලපෑම රූප සටහනක් ආධාරයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. " මිල ඉල්ලුම් නම්‍යතාව අර්ථ දක්වෙන්නේ භාණ්ඩයක මිල වෙනස් විමට ඉල්ලුම් ප්‍රමාණය ප්‍රතිචාර දක්වීමේ මට්ටම ලෙසය. "

i. භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් නම්‍යතාව මැනීමට යොදා ගනු ලබන ලක්‍ෂ හා චාප නම්‍යතාව අතර වෙනස පැහැදිලි කරන්න.

ii. පහත පරිදි ඉල්ලුම් වගුවක් ලබා දී ඇතැයි සිතමු.

| මිල (රු.) | 5 | 10 | 15 | 20 |
|---|---|---|---|---|
| ප්‍රමාණය (රු.) | 10 | 20 | 30 | 40 |

රුපියල් 15 සිට 10 දක්වා මිල පහත වැටීම සඳහා වන ලක්ෂ සහ චාප නම්‍යතාව ගණනය සොයන්න.

(ලකුණු 05)

ඇ. මිල ඉල්ලුම් නම්‍යතාවය තීරණය කරන සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඉ. පහත සංකල්ප පැහැදිලි කරන්න.

i. හරස් ඉල්ලුම් නම්‍යතාව සහ ආදායම් ඉල්ලුම් නම්‍යතාව

ii. සැපයුමේ මිල නම්‍යතාවය

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 04

අ. මිල සහ නිමැවුම් නිර්ණය සම්බන්ධයෙන් කතිපයාධිකාරි (oligopoly) වෙළඳපොලක්, ඒකාධිකාරි වෙළඳපොලෙන් වෙනස් වන්නේ කෙසේ ද ?

(ලකුණු 05)

ආ. ඒකාධිකාරි තරඟයේ නිෂ්පාදන ප්‍රභේදනය (product differentiation) වැදගත්කම කුමක් ද ?

(ලකුණු 05)

ඇ. ඒකාධිකාරි තරඟකාරිත්වය තුල සාමාන්‍යයෙන් දිගුකාලීනව එම කර්මාන්තය තුල ඇති ආයතන සාමාන්‍ය ලාභයක් උපයනු ලැබේ. මෙම ප්‍රතිඵලය වෙනස් කළ හැකි සාධක තුනක් විස්තර කරන්න.

(ලකුණු 05)

ඉ. ප්‍රචාරණය බොහෝ විට කතිපයාධිකාරි (oligopoly) වෙළඳපලක පවතින නමුත් පූර්ණ තරඟකාරි සහ පූර්ණ ඒකාධිකාරය තුළ නොපවතින්නේ මන්දයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 05

අ. පරිපූර්ණ තරඟයක් යටතේ සමාගමක කෙටි කාලින සහ දිගු කාලින සමතුලිතතාවය අතර වෙනස විස්තර කරන්න.

(ලකුණු 05)

ආ. "ඒකාධිකාරි තරඟය යනු පරිපූර්ණ තරඟය සහ ඒකාධිකාරය අතර මැදි තත්වයකි". මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. "පරිපූර්ණ තරඟකාරි කර්මාන්තයක, සමාගමක් කෙටිකාලීනව සමතුලිතතාවයේ පවතින්නේ එහි AC = AR=MR=MC විට පමණි." සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

ඉ. "ඒකාධිකාරි සමාගමක් භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීමේ නිරපේක්ෂ බලය භුක්ති විදින බැවින්, රජය විසින් ඒකාධිකාරය බිද දමමින් තරඟකාරි සමාගම් ඇති කළයුතු යැයි සමහරු විශ්වාස කරති. " මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 06

අ. "තමාන්‍යතා වක්‍රයක භාණ්ඩ දෙකක් පරිභෝජනය කිරීමෙන්, සමාන උපයෝගිතාවක් හෝ තෘප්තියක් ලබා දෙන සංයෝජනයන් නියෝජනය කරන ලක්ෂ්‍ය වල පිහිටීම ලෙස අර්ථ දැක්විය හැක".

i. සාමාන්‍ය භාණ්ඩ දෙකක් සඳහා උපයෝගිතා වක්‍රයක ප්‍රධාන ලක්ෂණ මොනවාද ?

(ලකුණු 05)

ii. ක්‍රම සූචක උපයෝගිතා සංකල්පය , සංඛ්‍යා සූචක උපයෝගිතා සංකල්පයෙන් වෙනස් වන්නේ කෙසේද ?

(ලකුණු 05)

ආ. පහත සඳහන් වියදම් සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න.

i. ප්‍රත්‍යක්ෂ සහ ව්‍යංග පිරිවැය (Explicit and implicit cost)

ii. ආවස්ථික පිරිවැය සහ ව්‍යංග පිරිවැය (implicit)

iii. ISO Quants වක්‍ර සහ ISO පිරිවැය

(ලකුණු 10)
(මුළු ලකුණු 20)